## ලග්ගල - පල්ලේගම ප්‍රාදේශීය සභාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 අප්‍රේල් 20 වනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2011 ජූනි 03 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2012 නොවැම්බර් 12 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

1.2 මතය

සභාපතිවරයා වෙත යවන ලද මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් හේතුකොටගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති ලග්ගල පල්ලේගම ප්‍රාදේශීය සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ). ස්ථාවර වත්කම්වල ශේෂය හා ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායකවීමේ ගිණුමෙහි ශේෂය එකිනෙකට සමාන විය යුතු වුවද එම ගිණුම් අතර රු.4,146,848 ක වෙනසක් පැවතුණි.

(ආ). සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතුව තිබුණු රු.1,867,148 ක හිඟ විශ්‍රාම වැටුප් දායකය වෙනුවෙන් ණයහිමියන් යටතේ ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඇ). ගබඩා ද්‍රව්‍ය මිළදී ගැනීම් සඳහා ගබඩා අත්තිකාරම් ගිණුම් ක්‍රමය අනුගමනය කිරීමකින් තොරව, මිළදී ගැනීම් සෘජුවම වැය ශීර්ෂවලට හරකර තිබුණි.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.21,508,833 ක්වූ ගනදෙනු විගණනයේදි සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.3 නොසැසඳූ ගිණුම්

ගිණුම් විෂයයන් දෙකකට අයත් පාලන ගිණුම් අනුව, ශේෂයන්ගේ එකතුව රු.435,358 ක් වූ අතර, උපයෝගී ලේඛන / වාර්තා අනුව, එකී ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.494,150 ක් වුයෙන් රු.58,792 ක වෙනසක් නිරීක්ෂණය විය.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්මවු ආදායම රු.1,111,126 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවු ආදායම රු.356,480 ක් විය.

2.2 මූල්‍ය පාලනය

(අ). සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පිළියෙළ කරන ලද අංක 122-1-001-4-0000003 දරන බැංකු ගිණුමට අදාළ බැංකු සැසඳුම් ප්‍රකාශයෙහි දැක්වෙන 2005 වර්ෂයට පෙර සට පැවත එන රු.3,694 ක උපලබ්ධි නොවූ තැන්පතු හා 1998 සිට 2008 දක්වා කාල පරිච්ඡේදයට අයත්, රු.13,069 ක වැඩියෙන් ගෙවීම් ලෙස දැක්වෙන ශේෂයක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ). 2008 වර්ෂයේදි වී මිලදී ගැනීම සඳහා හිටපු සභාපතිවරයකු වෙත දෙන ලද රු.300,000ක අත්තිකාරම් පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ). අවිනිශ්චිත ගිණුමේ පවතින 2007 සිට 2011 දක්වා කාල පරිච්ඡේදයට අදාල ශේෂයන් පිළිබඳ සොයා බලා නිරවුල් කිරීමට කටයුතු කිරීමකින් තොරව පැවතුණි.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම,තත්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තබූ ඇස්තමේන්තුගත ආදායම්, තත්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තත්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. '000 | රු. '000 | රු. '000 |
| (i) වරිපනම් හා බදු | 2 | - | 72 |
| (ii) බදු කුලි | 607 | 484 | 208 |
| (iii) බලපත්‍ර ගාස්තු | 537 | 543 | - |
| (iv) වෙනත් ආදායම් | 10,012 | 9,236 | 3,246 |

2.3.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i). | උසාවි දඩ | 2,784,100 |
| (ii). | මුද්දර ගාස්තු | 150,650 |

2.3.3 හිඟ අක්කර බදු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 (1) (අ) වගන්තියට අනුව නොගෙවන ලද අක්කර බදු සම්බන්ධයෙන් කඩිනමින් කටයුතු කර අයකර ගතයුතු වුවත්, එසේ කටයුතු නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ හිටි අක්කර බදු ශේෂය රු.72,532 ක් විය.

2.4 නිශ්ක්‍රිය හා ඌන උපයෝජිත භෞතික සම්පත්

වටිනාකම රු.727,500 ක් වූ වත්කම් විෂයයන් 04 ක් හා වටිනාකම ගණනය කර නොමැති වත්කම් විෂයයන් 03 ක් නිශ්ක්‍රියව හො ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

2.5 හඳුනාගත් පාඩු හා හානි

සමාලෝචිත වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව, සභාව සතුව පැවති ඩිජිටල් කැමරාවක් හා ඊට අදාළ මෙමරි කාඩ්පතක ඌනතාවයක් අනාවරණය වී තිබුණු අතර, අලාභයට වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකිරීමට කටයුතු කර නොතිබුණි.

2.6 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනදෙනු

(අ). අතිකාල හා නිවාඩු දිනවල රාජකාරි කිරීම පූර්ව අනුමැතියක් මත සිදු කළ යුතු වුවද, එබදු අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂයේ රු.195,806 ක අතිකාල හා නිවාඩු දින වැටුප් ගෙවා තිබුණි.

(ආ). 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 19(1) (1) වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව තනතුරක් ඇති කිරීම,වැටුප් නියම කිරීම පිණිස පළාත් පාලන කොමසාරිස්වරයාගේ පූර්ව අනුමැතිය ලබාගත යුතු වුවද, එබදු අනුමැතියකින් තොරව සේවකයින් 15 දෙනෙකු ආදේශක පදනම මත බඳවා ගෙන සමාලෝචිත වර්ෂය තුළ රු.1,336,244 ක වැටුප් ගෙවා තිබුණි.

2.7 අවිධිමත් ගනදෙනු

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4,6.3 ඡේද හා 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන ) රීති මාලාවේ 207 හා 208 රීති ප්‍රකාරව මිලදී ගැනීම් වලදී තරඟකාරී ලංසු ක්‍රමය හා ලියාපදිංචි තැපැල් මගින් මිල ගණන් කැඳවිය යුතු වුවත්, ඊට පටහැනිව අත්මිල ගණන් මත සමාලෝචිත වර්ෂයේ අවස්ථා 02 කදී රු.316,678 ක ගබඩා ද්‍රව්‍ය හා උපකරණ මිලදී ගෙන තිබුණි.

2.8 කොන්ත්‍රාත් පරිපාලනය

කිවුලවාඩිය ජල ව්‍යාපෘතිය ඉදිකිරීම සඳහා රු.1,400,000 ක ගිවිසුමකට එළඹ තිබුණි. ගෙවීම් බිල්පතෙහි වැඩ විෂය අංක 03 හි සඳහන් මි.මී.63 ගේට්වෑල් 01 ක් සවිකිරීම වෙනුවෙන් රු.10,223 ක් ගෙවා තිබුණද, එවැනි ගේට්වැලයක් සවිකර නොතිබුණු අතර, වැඩ විෂය අංක 10 යටතේ මි.මී.40 පිත්තල නැවතුම් කරාමයක් සවිකිරීම වෙනුවෙන් රු.5,897 ක් ගෙවා තිබුණද, ඒ සඳහා ප්ලාස්ටික් නැවතුම් කරාමයක් සවිකර තිබුණි. ශක්‍යතා අධ්‍යයනයකින් තොරව ඉදිකිරීම් කර තිබුණු මෙම ව්‍යාපාතිය ප්‍රමාණවත් ජල මූලාශ්‍රයක් නොමැතිකම හා නිසි ප්‍රමිතියකින් තොරව ඉදිකිරීම් කර තිබුණු බැවින්, 2012 සැප්තැම්බර් 26 විගණන දිනය වන විට ප්‍රයෝජනයට ගැනීමකින් තොරව අතහැර දමා තිබුණි.

)

2.9 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-----------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ .

(අ). අංක WPLF 4859 දරන කැබ්රථය ඇලුත්වැඩියා කටයුතු සඳහා ගරාජයකට 2011 දෙසැම්බර් මාසයේදී භාරදී තිබුණි. අලුත්වැඩියා කටයුතු අවසන් කර ආපසු භාර ගැනීමට විගණන දිනය වූ 2012 සැප්තැම්බර් 26 දින වන විටත්, කටයුතු කර නොතිබුණි.

(ආ). ග්‍රාමීය ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය මගින් සභාවට පරිත්‍යාග කර තිබූ අංක CPTX 6002 හා CPTX 6005 දරන යතුරු පැදි 02 හි හිමිකම සභාවට පවරා ගැනීමට හා එහි වටිනාකම තක්සේරු කර ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ ). විධිමත් ගිවිසුමකට එළඹීමකින් තොරව අංක CPRB - 2996 දරන ට්‍රැක්ටරය මොරගහකන්ද කළුගඟ යෝජනා ක්‍රමය සඳහා පැයකට රු.290 බැගින් කුලී පදනම මත ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට 2011 සැප්තැම්බර් 24 දින සිට ලබාදී තිබුණි.

3. පද්ධති හා පාලන

-------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). ගිණුම්කරණය

(ආ). අයවැය පාලනය

(ඇ). ආදායම් පරිපාලනය

(ඈ). ණයගැති හා ණයහිමි පාලනය

(ඉ). කොන්ත්‍රාත් පරිපාලනය